**විල්ගමුව ප්‍රාදේශීය සභාව - 2020**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

විල්ගමුව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට විල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගනන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i) | ප්‍රාදේශීය සභා කාර්යාලය අලුත්වැඩියා කිරිම අධියර II කර්මාන්තයට වැය කළ රු.330,000 ක මුදල් ණයහිමියන්ගෙන් අත්හැරීතිබුණි. | 2021ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| ii) | ණයහිමියන් සඳහා සමාලෝචිත වර්ෂයේ දී ගෙවූ මුදල ගණනය කිරිම් අනුව රු.19,895,311 ක් වුවද ණයහිමි ගිණුමේ එය රු.17,943,633 ක් ලෙස රු.1,951,678 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| iii) | කර්මාන්ත ණයගැතියන් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.19,895,311 ක මුදලක් ලැබි තිබූ නමුත් ණයගැති ගිණුමේ ලද මුදල් ලෙස රු.12,571,311 ක් සටහන් කිරීමෙන් කර්මාන්ත ණයගැති ශේෂය රු.7,324,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගනුදෙනු නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |
| iv) | සමාලෝචිත වර්ෂයේ රු.500,000 ක් ණයහිමි ගෙවීම්, අත්තිකාරම් ගෙවීමක් ලෙස සටහන් කර තිබුණි. | 2021ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගනුදෙනු නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |
| v) | ඉකුත්වර්ෂයේ මිලදිගත් රු.650,000 ක් වටිනා ඇලුමිණියම් ජල බවුසරය එම වර්ෂයේ මෝටර් රථ හා කරත්ත තුළ ගිණුම්ගතකර තිබියදී 2020 වර්ෂයේදි නැවත යන්ත්‍ර හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2021ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | මිලදී ගැනීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| vi) | සමාලෝචිත වර්ෂයේ ක්ෂේත්‍ර ගබඩා, ලිපිද්‍රව්‍ය ගබඩා, අවසන් තොග, ගණනය කර ගිණුම්ගත නොකර තොගවල ආරම්භක ශේෂය අවසන් ශේෂය ලෙසට ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව | මූලා ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| vii) | ණයගැතියන් වෙනුවෙන් ලද රු.1,670,000 ක මුදල උසාවි දඩ මුදල් ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2021ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූලා ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| viii) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු වෙනුවෙන් ලද රු.106,500 ක මුදල බැංකු සැසඳුම් ප්‍රකාශයේ ඍජු හර කිරීම් ලෙස දක්වා තිබුණි. | 2021ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූලා ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| ix) | සමාලෝචිත වර්ෂයේ රු.84,000 ක් විශේෂ අත්තිකාරම් නිකුත් කිරීම්, සේවක ණය ශේෂයට ඇතුළත් නොකර, අතුරු අග්‍රිම ගිණුමේ ගිණුම්ගත කර තිබුණි. | 2021ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූලා ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

### 1.6.2 අවිනිශ්චිත ගිණුම්

--------------------

දීර්ඝ කාලයක සිට පැවත එන වටිනාකම රු.1,501,545 ක් වූ අවිනිශ්චිත ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.7 අනුකූල නොවීම්

-----------------

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

-----------------------------------------------------------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 1988 දෙසැම්බර් 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත | වෙළඳ බලපත්‍ර හිමි ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළයුතු වුවත්, ව්‍යාපාර 120 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | විගණිත කරුණ පිළිගන්නා බවත් නිලධාරීන් ඌනතාවය මත මෙම කාර්යයන් මග හැරීමක් සිදු වුවද මේ වන විට විෂයය කටයුතු යාවත්කාලීන කරමින් පවතින බව | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ අදායම රු.1,139,387 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,559,960 ක් විය. මීට ප්‍රධාන හේතු ලෙස වැටුප් හා දීමනා වැඩිවීම, ප්‍රාග්ධන වියදම් හා ප්‍රවාහන වියදම් වැඩිවීමද, සේවා හා කුලී ආදායම් අඩුවීම මෙම විචලනයට හේතු වන බව නිරීක්ෂණය විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | වරිපනම් හා බදු | | |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට රාජ්‍ය අංශයේ හිඟ රු.143,292 ක් ඇතුළුව රු.402,077 ක් වූ හිඟ වරිපනම් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | දේපල තහනම් කර මෙම හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය අනුව හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වර්ෂ 05 න් 05 ට වරිපනම් තක්සේරු කළ යුතු වුවද2011 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත වරිපනම් අයකිරීම හේතුවෙන් සභාවට හිමිවිය යුතු ආදායම් අහිමි වී තිබුණි. | අවසන් තක්සේරු වාර්තාව ලැබුණු පසු අය කිරීමට කටයුතු කරන බව | සභාවට උපයා ගත හැකි ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එකතුව රු.847,708 ක් වූ ජල ගාස්තු අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | නොගෙවන ලද ජල පාරිභෝගිකයන්ගේ ජල සැපයුම් විසන්ධි කර අවශ්‍ය කටයුතු සිදු කරන බව | හිඟ මුදල් කඩිණමින් අය කළ යුතු වීම. |
| | කුලී | | |
| | දිර්ඝ කාලයක් තිස්සේ පොදු වෙළඳපල කඩ කාමර 11 හි කුලිය රු.897,069 කට ඇස්තමේන්තු කර තිබුණද එහි අයිතිය සභාවට පවරා ගැනිමට කටයුතු නොකිරිම හේතුවෙන් නව තක්සේරුවක් මත බදු දී සභාවට ලබාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි. | මෙම කඩ කාමර පවරා දෙන ලෙස ඉල්ලීම් කර ඇතත් මේ දක්වා පවරා දී නොමැත. තවද, හෙට්ටිපොල නගරයේ සියළුම ඉඩම්වල මෙම ගැටළුව පවතින බව | සභාවට උපයා ගත හැකි ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.910,704 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක වටිනාකම නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 10 දින සභාවේ කැබ් රථය ලොරි රථයක් සමඟ ගැටී සිදුව තිබූ අනතුරෙන් සිදුවී තිබුණු අලාභය මුදල් රෙගුලාසි 104(3) පරීක්ෂණ වාර්තාව අනුව රු.1,670,381 ක් වූ අතර අනතුර සිදුවන අවස්ථාවේ කැබ් රථය රාජකාරි ගමනක යෙදුණු බවට කරුණු තහවුරු වී නොතිබුණි. මුදල් රෙගුලාසි 104(4) අවසන් පරීක්ෂණයක් පවත්වා වගකීම් නිශ්චය කර අලාභය අය කර නොතිබුණි. | අලාභය අය කර ගැනීමට පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ තනතුරු 09 ක් සඳහා පුරප්පාඩු 24 ක් පැවතුණි. | මෙම සේවක පුරප්පාඩු සම්බධයෙන් ඉහළ කළමනාකාරිත්වයට දන්වා ඇත්තෙමි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටලු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 24 දිනැති ප.පා.කොමසාරිස්ගේ අංක 4/1/2020 දරන චක්‍රලේඛයට පටහැනිව විල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ රැස්කළ ප්‍රතිචක්‍රීකරණය කළහැකි කසළ ටොන් 0.150 ක් දිගම්පතහ කවෂිමා කසල අංගනයට භාරදී තිබුණි. | චක්‍රලේඛය මගින් දැනුවත් කර ඇතත් ප්‍රායෝගිකව මතු වූ ගැටළු හා ඒ ආශ්‍රිතව ගත හැකි විසඳුමක් ලෙස සභා අනුමැතිය යටතේ මෙම තීරණය ගෙන ඇති බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | පරිසර ආරක්ෂණ බලපත්‍ර කාල සීමාව ඉක්මවා තිබූ ව්‍යාපාර 4 ක නැවත අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමට කටයුතු කරමින් පවතින බව | 1988 අංක 56 දරන පාරිසරික පනත ප්‍රකාරව ක්‍රියාත්මක කළ යුතු වීම. |